සැ. යු.- 2013.06.07 දින පළ වූ අංක 1,814 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,815 - 2013 ජුනි මස 14 වැනි සිකුරාදා - 2013.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 912 |

*සැ. යු.-* (i) ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2011 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) තොරතුරු ලබා ගැනීමේ නිදහස පනත් කෙටුම්පත, 2011 මැයි මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජුනි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විවිධ දැන්වීම්

**සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන (කොළඹ දී පැවැත්වෙන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

නඩු අංකය : HC (Civil)/ 10/2013/ Co.

කොළඹ 04, ජෝෂප් පටුමග, අංක 28 දරන ස්ථානයේ ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී පිළිබඳ කාරණාවේ දී ය.

*එදිරිව*

ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක කාරණයේ දී ය.

කොළඹ 02, මැලේ වීදිය, අංක 121 දරන ස්ථානයේ පදිංචි ෆිරෝස් අස්ගර්අලි අබ්බාස්බෝයි මුල්ලා මුසාජ්.

........................................................පෙත්සම්කරු.

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ කොළඹ 02, මැලේ වීදිය, අංක 121, දරන ස්ථානයේ පදිංචි ෆිරෝස් අස්ගර්අලි අබ්බාස්බෝයි මුල්ලා මුසාජ් විසින් වර්ෂ 2013ක් වූ මාර්තු මස 27 වැනි දින ඉදිරිපත් කර ඇති බවත්, එකී පෙත්සම වර්ෂ 2013ක් වූ ජූනි මස 27 වැනි දින මහාධිකරණය ඉදිරියේ ඇසීම සඳහා නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට අපේක්ෂා කරන එකී සමාගමේ යම් ණය හිමියකු හෝ දායකයකු නඩුව අසනු ලබන අවස්ථාවේ දී එම කාර්යය සඳහා පුද්ගලිකව තම නීතිඥවරිය මගින් හෝ නීතිඥවරයා මගින් පෙනී සිටිය හැකි බවත්, එය අවශ්‍ය කරන එකී සමාගමේ ණය හිමියකුට හෝ දායකයකුට ඒ සඳහා වූ නියමිත ගාස්තු ගෙවූ පසු පහත අත්සන් කළ අය විසින් පෙත්සමේ පිටපතක් සපයනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කලේ :* සුද.ත් පෙරේරා ඇසෝසියේට්ස්,
අංක 5, 9 වැනි පටුමග, නාවල පාර,
රාජගිරිය.

*සටහන :*

එකී පෙත්සම අසනු ලබන අවස්ථාවේ දී පෙනී සිටීම අපේක්ෂා කරන යම් තැනැත්තෙකු විසින් එසේ කිරීමට ඇති තම අපේක්ෂාව දැන්වීම ලිඛිතව ඉහත නම් සඳහන් සුදත් පෙරේරා ඇසෝසියේට්ස් වෙත භාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවිය යුතු ය. දැන්වීමේ පුද්ගලයාගේ නම හා ලිපිනය ප්‍රකාශ කළ යුතු ය. නැතහොත් සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය ප්‍රකාශ කළ යුතු අතර, එයට එම තැනැත්තකු විසින් හෝ සමාගම විසින් නැතහොත් (සිටී නම්) ඔහුගේ හෝ ඇයගේ නීතිඥවරයකු විසින් අත්සන් කළ යුතු වන අතර, එය වර්ෂ 2013 ක් වූ ජූනි මස 26 වැනි දින පස්වරු 6.00 ට පෙර ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ භාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවනු ලබන්නේ නම්, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ඇතිව තැපෑලෙන් එවිය යුතු ය.

සුදත් පෙරේරා ඇසෝසියේට්ස්.

අංක 5,
9 වැනි පටුමග, නාවල පාර,
රාජගිරිය.

06-349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.